# අන්ධයා සහ

ශල්‍ය කර්මයක් මඟින් ඇසේ පෙනීම ලබා ගැනීම පිණිස මුදල් සම්මාදන් කරන එක් අන්ධ තරුණයෙක් මගේ නිවසට ද පැමිණියේ ය.

"ඔබ පෙනීම ලබා ගන්නේ කුමට දැ" යි මම ඇසීමි. ඔහුගේ මුහුණේ විස්මය පිරි සිනහවක් ඇඳී මැකී ගියේ ය.

"මහත්තයා, මේ ලෝකය දිහා බලන්න මාත් ආසයි." හේ කී ය.
"දෑස හැර නැරඹීමට තරම් සුදුසු ලෝකයක් නොවේ මේ. ඇත්තන් විසින් නැත්තන් ගසා කන ආසාධාරණයෙන් අගතියෙන් පිරුණු මේ ලෝකය නොපෙනුණු තරමට හොඳයි."
මම කීවෙමි.

"ඉතින් මහත්මයා ඔබටත් පහසුවෙන් ම අන්ධයෙක් වීමට පුළුවන් නේ ද?" කී අන්ධ තරුණයා ඇඟිලි තුඩින් සිය දෑස පිරිමැද්දේ ය. ඔහු මඳ වේලාවක් කල්පනාකාරීව සිටියේ ය."

"ඇත්තටම මහත්මයා ඔබට අන්ධයකු වීමට වුවමනා නැහැ. ඔබ නියම අන්ධයෙක්. නැත්තන් ගසා කන්නට ඇත්තන්ට ඉඩ දෙන ආසාධාරණයට - අගතියට හිස නමා හඬා වැලපෙන යායුතු මඟක් නොදකින ඔබත් අන්ධයෙක්. සපුර පිරුණු ලොව කඩා බිඳ දමා නව ලොවක් ගොඩ නැගීමේ මඟ නොදන්නා ඔබ ජාත්‍යන්ධයෙක්."

මම වට පිට බැලීමි. ඔහුගේ කැටයට සත පනහක් දමා ගෙතුළට පැන දොර වසා ගතිමි.

